ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය
போக்குவரத்து, பெருந்தெருக்கள், துறைமுகம் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சு
Ministry of Transport, Highways, Ports and Civil Aviation

| මගේ අංකය / எனது இல / My Number | ඔබේ අංකය / உமது இல / Your Number | දිනය / திகதி / Date | 2024.11.09 |
|---|---|---|---|

**<u>පොතුහැර සිට රඹුක්කන දක්වා මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වන කොටස ( අදියර III ) 2026 වසර අවසන් වන විට නිම කිරීමට ගරු අමාත්‍ය විජිත හේරත් මහතාගෙන් උපදෙස්.</u>**

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල්ගුවන්සේවා ගරු අමාත්‍ය විජිත හේරත් මහතා විසින් අද දහවල් මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වන අදියරේ කටයුතු පොතුහැර සිට රඹුක්කන දක්වා මාර්ගයේ සිදු වන ආකාරය නිරීක්ෂණය කරන ලදී.

එහිදී මේ මාර්ගයේ විශේෂ අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කළ ඇමතිවරයා නිළධාරීන්ට උපදෙස් දෙමින් කියා සිටියේ ලබන වසරේ ( 2026.12.31 ) අවසානය වන විට මේ මාර්ග කොටසේ කටයුතු සම්පූර්ණයෙන් නිම කළ යුතු බවයි.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මාර්ග සංවර්ධන කටයුතු විධිමත් ලෙස සිදු කිරීම වෙනුවෙන් පොතුහැර සිට රඹුක්කන දක්වා මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වන කොටස ( අදියර III ) හැකි ඉක්මණින් නිම කිරීම අත්‍යවශ්‍ය වී තිබුණි. ඒ අනුව ගරු අමාත්‍ය විජිත හේරත් මහතාගේ මැදිහත් වීමෙන් දැනට මේ සඳහා ඇති බාධක හැකි තාක් අවම කර ලබන වසර අවසන් වන විට නිම කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය විය.

මෙහිදී මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ඊ. පාස්කරන්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් S.M.P. සූරියබණ්ඩාර, ව්‍යාපෘති අධ්‍යක්ෂ අනුරාධ හෙට්ටිආරච්චි ඇතුලු නිළධාරීන් මහතුන් සහභාගි විය.

මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත්තේ වසර 2023.07.04 දින ය. ගලගෙදර දක්වා සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල වන්නේ රුපියල් බිලියන 210 කි. මංතීරු 04 ක් වන මෙම මාර්ගය සම්පූර්ණයෙන් පොතුහැර සිට ගලගෙදර දක්වා කිලෝමීටර් 32.4 කින් යුක්තය.

සුරංග ලක්මාල් සෙනෙවිරත්න
මාධ්‍ය ලේකම්

වරාය , නාවික සහ සිවිල් ගුවන්සේවා අංශය
துறைமுகம், கடற்படை மற்றும் சிவில் விமானப் பிரிவு
Ministry of Ports, Shipping & Civil Aviation Division
අංක 19,චෛත්‍ය පාර ,කොළඹ 01, ශ්‍රී ලංකාව
சைத்திய 19 வீதி ,கொழும்பு இலங்கை
No. 19, Chaithya Road, Colombo 01, Sri Lanka

ලේකම් / செயலாளர் / Secretary: +94 (0) 11 2320252
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail: secretary@portmin.gov.lk
කාර්යාලය / அலுவலகம் / Office: +94 (0) 11 2439352
ෆැක්ස් / தொலைநகல் / Fax No: +94 (0) 11 2435134